## කවි කොළය



# කේ.පී. K P

පිරිබාහරන් මළ පසු නායක    කමට
පත්වුණු තැනැත්තා අල්ලාගෙන    ඇමට
හිරකාරයෙකු ලෙස ගෙන ආවත්    නමට
කෙරුමෙක් වී සිටී වැඩියෙන් අන්    හැමට

කේ පී කෝටිපතියෙකි බටහිර    පැත්තේ
ඔහු සතු යෝධ නැව් හමුදාවක්    ඇත්තේ
පළවිය පුවත් - රජයත් එය පිළි    ගත්තේ
ඒ ගැන හායි හූවක් වත් දැන්    නැත්තේ

වරෙකදි කියයි ඔහු පසුවෙයි හිර    බාරේ
ඇවිදී නිදහසේ වන්නියෙ මහ    පාරේ
වරදක් කොතන හෝ සිදුවන බව    තේරේ
මේකා මැරුණු මහ කොටියගෙ    අවතාරේ

කේ පී ලෝක බැංකුව බව රජය    සිතයි
උතුරේ දියුණුවට ඔහුගේ සහය    පතයි
මොහු අත ඩයස්පෝරාවෙහි බලය    ඇතැයි
ලස්සන කතා කෙහෙළිය වැනි පිරිස    ගොතයි


කවදත් එජාපය අලි කට අරිනු    හොරයි
ජේවීපීය පමණක් හඬ අවදි    කරයි
හෙළ උරුමයත් වාසිය පැත්තටම    බරයි
ඔහුගේ කිළුටු සෝදන්නට වෙහෙස    දරයි

අන්තිම පැයේ අතරින් යුද ගිනි    තැවුල
බේරාගන්න මහ කොටියා සහ    පවුල
නැතිවිය මුදල් - ඒකයි සිදුවුණු    අවුල
කේ පී කියයි අතගා නිකටෙහි    රැවුල

ඉන්දිය රජය නෑයෙකුහට ඔහුට    ලැදි
එරටට ඇතුල්වන්නට අවසරය    නොදි
තහනම් කළා ඒ මතයෙහි දැඩිව    හිඳි
ලංකා රජය හම්පඩ කොටියෙකුට    වඳි

සරණාගත අයට සලකන උතුරු    දෙසේ
වැඩ පිළිවෙලක් ඔහු ළඟ ඇත කියනු    ඇසේ
යුද අවි නැව් පිටින් එව් කොටියෙකුට    මෙසේ
නැත දඬුවමක් එය පිළිගත හැකිද    කෙසේ?

පෙන්වයි කිඹුල් ඇස්වල
බොරු කඳුළු    ගුලි
ගසමින් දිනක හැමගෙම
ඇස්වලට    වැලි
මේ කැණහිලා පැනගොස්
දවසකදි    යලි
නැවතත් වරක් රටටම
මහ කෙළිය    කෙළී!



♦ තලන්ගම ජයසිංහ
Sri Lanka

# වෛද්‍යවරයා සහ සංගීතඥයා
# Dr ජීවා සිරිවර්ධන



කෘතහස්ත වෛද්‍යවරයෙකු සේම, සංගීතඥයෙකු හා සෞන්දර්යකාමියෙකු මෙන්ම, තම රටට බෙහෙවින් ආදරය කළ මාහැඟි ලංකා පුත්‍රයෙකු දැනට සති දෙකකට පෙර ලන්ඩන යේ ගෝල්ඩ්ස් ග්‍රීන් සුසාන භූමියෙන් අවසන් ගමන් ගියේය. ඒ වෛද්‍ය ජීවේන්ද්‍ර සිරිවර්ධන මහතාය. ඩොක්ටර් ජීවා යනු බොහෝ දෙනා ආදර යෙන් ඔහු ඇමතූ නාම යයි. පැරණි ගීතයන්ට බෙහෙවින් ප්‍රිය කළ ඩොක්ටර් ජීවා බොහෝ විට ලන්ඩන යේ ලාංකික හිතවතුන් එක් රැස්වූ ප්‍රිය සම්භාෂණයන් රසවත් කළේ ඒවා ගායනයෙන් පමණක් නොව සර්පිනාවද වාදනය කරමිනි. අමරදේව, සුනිල් සාන්ත, කාන්ති වක්වැල්ල, සී. ටී. ප්‍රනාන්දු ආදී අතීත යුගයන්ට අයත් ගායක ගායිකාවන්ගේ ගීත ප්‍රිය කළ ජීවා ඒවා මනරම් ලෙස ගායනා කරන්නටද හැකියාව ලද්දේය. එසේම වෛද්‍ය වෘත්තියෙන්ද, ඉහළ තැනක සිටි ඔහු ශල්‍ය වෛද්‍යවරයෙකු ලෙස ශ්‍රීලංකාවේ සහ එක්සත් රාජධානියේ නොයෙක් රෝහල් වල සේවය කර ඇත.

මාතර උපත ලබා ඇති දොස්තර සිරිවර්ධන මහතා ගාල්ලේ මහින්ද හා රිච්මන්ඩ් විද්‍යාලවලද, කොළඹ ආනන්ද මහා විද්‍යාලයේද ආදි ශිෂ්‍යයෙකි. ඔහුගේ ආදරණීය බිරිඳ සීතා ද වෛද්‍යවරියකි. සිරිවර්ධන යුවල ලන්ඩන් බෞද්ධ විහාරයේ භක්තිමත් දායකයෝ වෙති. ඔවුන්ට පුතෙක් හා දියණියන් දෙදෙනෙකි. ඒ තිදෙනද වෛද්‍යවරුන් වන අතර ඔව්හු එක්සත් රාජධානයේ වෛද්‍ය සේවයට සම්බන්ධව සේවයේ නිරතව සිටිති.

සිරිවර්ධන මහතාගේ කැපී පෙනෙන ගුණයක් වූයේ තමා ඉහළ පෙලේ වෛද්‍යවරයෙකු ලෙස නොව හැම විටම නිහතමානී වාම් එමෙන්ම සරල මිනිසෙකු ලෙස ජීවත්වීමයි. ඒ ජීවිතය සංගීතයෙන්ද කලාවෙන්ද සුහද මිතුරු ඇසුරෙන්ද පෝෂණය වූවකි. එක්සත් රාජධානියේ බොහෝ අය දොස්තර ජීවා හඳුනන්නේ ගායකයෙකු හා සංගීත ලෝලයෙකු වශයෙන් මිස වෛද්‍යවරයෙකු ලෙස නොවේ. ඔහු වෛද්‍ය වෘත්තියට වඩා සංගීත අංශයට ඇළුම් කළ බව ඔහු ගැන දන්නා බොහෝ දෙනාගේ පිළිගැනීමයි. එහෙත් සිරිවර්ධන මහතාගේ අවසන් කටයුතු සිදුවන මොහොතේ ඔහුගේ පුත්‍ර මහාචාර්ය අජිත් සිරිවර්ධන මහතා කළ කතාවෙන් හෙළිවූ බොහෝ කරුණු ඇසූ කාගේත් සිත් පුදුමයට පත්වුණේ ඩොක්ටර් ජීවා තරුණ වියේ දී වෛද්‍ය අංශයෙන් මෙන්ම සෞන්දර්ය අංශයෙන්ද කොතරම් ක්‍රියාශීලී පුද්ගලයෙකුව සිටියේද යන්නය. වරක් ඔහු ගල්කිස්සේ සිට ගෝල්පේස් දක්වා මුහුදේ වූ පිහිණුම් තරඟයකට සහභාගි වී ඉන් ජයග්‍රහණය කළ අයුරුද කියැවිණ. එසේම ලෝකය පුරා රෝගීන් සුවපත් කරමින් රටින් රට ගිය සුප්‍ර කට හෝප් නැව ලංකාවට ආවෙලේ Dr ජීවා ශල්‍ය වෛද්‍යවරයෙකු ලෙස ස්වේච්ඡාවෙන් එම හෝප් නැවේ ද සේවය කර තිබේ.

දොස්තර ජීවා සිරිවර්ධන මහතාගේ අවසන් කටයුතු සිදුවෙමින් යන අන්තිම මොහොතේ පසුබිමින් විශාරද අමරදේවයන්ගේ සුප්‍රකට දේශාභිමානී ගීතය, එනම්, සසර වසන තුරු වාදනය වීය. සැබැවින්ම එය සිරිවර්ධන මහතාගේ ප්‍රාර්ථනාව වූ බවට ද සැක නැත. විශ්වයේ අප කොයි කෙළවරේ සිටියද අපේ මව්බිමට හා සංස්කෘතියට අයත් කිසිවක් හැමවිටම අප අතේ මිටමොළවාගෙන සිටිමු. අවසන් මොහොතේත් එය එලෙසම රැඳී පවතී.

දොස්තර ජීවා සිරිවර්ධන මහතාට උතුම් වූ අමා මහ නිවන් සුව ප්‍රාර්ථනා කරමු!

♦ වෙනුර



# පකිස්ථානයේ මහා ගංවතුර
# Floods in Pakistan




**ඉරිදා**- ලංකාවෙ පාර්ලිමේන්තුවෙ 18 වෙනි සංශෝධනය
**SUN** ගෙනැල්ල ජනාධිපතිවරයගෙ කාල සීමාව ඒඅනුව දික් කරගෙන කියලා රජයට විරුද්ධ කොළඹ පෙළපාලි ගිහින් ඒ විස්තර පත්තරවල තිබුණා. හැමදාම කරනව වගේ පඹයො හදාගෙන ගිහිං පුච්චලා. ඒ කරන දේවල් වලින් වැඩක් තියනවද කියලා මම සෝමතුංග බාප්ප ගෙන් ටෙලිපෝන් කරපු වෙලාවෙ ඇහුවා. බාප්ප කියන වා, වැඩක් තිබුණත් නැතත් ඒවගේ දේවල් වලින් තමයි රටක් අවදියෙන් ඉන්නවා කියලා පේන්නෙ කියලා. මං කිව්වා බාප්පෙ අපි කවුරුත් ඉතින් දවල්ට අවදියෙන් තමයි ඉන්නෙ කියලා. බාප්ප කියනවා ලංකාවෙ හොඳට නින්ද යන්නෙ දවල්ටය කියලා. රෑට මදුරුවො හන්දයි, බල්ලො බුරන හන්දයි, හොරු එනවටයි මුළු ලංකාවම ඇහැ ඇරිලයි ඉන්නෙ කිව්වා.

**සඳුදා**- අපේ දැන් ලංකාවෙ එක එක ජාතියෙ බිස්කට්
**MON** නිශ්පාදනය පටන් අරන්. චොකලට්, මාරි, ක්‍රීම් ක්‍රැකර් වගේ බිස්කට් වෙනුවට දැන් ඖෂධ බිස්කට් එහේ හදන්න පටන් අරගෙනලු. මංචි කොම්පැණියෙන් කුරක්කන් බිස්කට්, කරපිංචා බිස්කට් හදලා විකුණන්න හිටියට පස්සෙ වෙදමහත්තුරු කීප දෙනෙක් ආයුර්වේද බිස්කට් හදනවයි කියලා ලොකු නැන්ද කිව්වා. හාතවාරිය බිස්කට්, වැල් පෙනෙල බිස්කට්, පත්පාඩගම් බිස්කට්, වෙනිවැල් ගැට බිස්කට් ඔය ආදි වශයෙන් මහ ගොඩක් වර්ග. නිශ්පාදක වෙද මහත්තෙයා කියනවලු පිට ගැස්ම හැදුණු ලෙඩාට, වෙනිවැල්ගැට බිස්කට් එකක් කාලා, කොත්තමල්ලි කෝප්පයක් බොන්න කියලා. ඒ තමයි අළුත්ම ක්‍රමය. දැන් කසාය බොන්න ඕන නෑ. ෂහ්! මරු නේ.

**කුජදා** - අපේ හිටපු අගමැති ටෝනි බ්ලෙයාර්ගෙ එයාගෙ
**TUE** දේශපාලන ගමන ගැන ලියපු පොත පිටවෙලා. ඒ පොතේ බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවෙ ඉන්න හැමෝටම පස් පඩංගුවෙ බැනලා, දොස්කියලා. වැඩියම ඒකෙ බැනලා තියෙන්නෙ අද ඉන්න අගමැති ගෝර්ඩන් බ්‍රවුන්ට. බ්ලෙයාර් මහරජිණටත් දොස් කියලා, රැජින මහ බෝරිංගැනියෙක් කියලා. අනේ අපිට නම් රැජිණ කිසිම බෝරිං ගතියක් නැහැ. ඒ මනුස්සයගෙ පාඩුවෙ ඉන්න කෙනෙක්. හැබැයි ඒ පොත හෝගාලා විකිණෙන්වලු. වැඩියම අරන් තියෙන්නෙ මෙහේ පාර්ලිමේන්තුවෙ ඉන්න කට්ටිය. ඒ ගොල්ලන්ටත් බැනලා තියනවද බලන්න. හුග දෙනෙක් කියන්නෙ ටෝනි බ්ලෙයාර් ඒ පොත ලිව්වට වැඩිය හොඳයි නොලිව්ව නම් කියලා. සමහරු හිතනවා බ්ලෙයාර් මේ වැඩෙන් ලේබර් පාටිය තවත් සවුත්තු කළාය කියලා. ඒක නම් හරි ඇත්ත

**බුදදා-** 18 වෙනි සංශෝධනයෙන් ලංකාවෙ ජනාධිපති
**WED** වරයා කාලය දිග්ගස්ස ගත්ත එක ගැන මම ආතර් මාමගෙන් ඇහුවා පෙරේදා. මම කිව්වා ඒ වැඩේ වැරදියි කියලා. මහින්ද චින්තනයෙ පොතේ මුලටම තියෙන්නෙ විධායක ජනාධිපති ධූරය අහෝසි කරනවයි කියලා. දැන් මොකක්ද මේ කළේ කියලා මාමාගෙන් ඇහුවා. ඒකට එයා දුන්න උත්තරේ මේකයි. ඔය සේරම ඡන්දෙ දුන්නෙ ඒගොල්ලන්ගෙ කැමැත්තෙන්ම. මොකෝ බය කරලා, පිහිය පෙන්නලා, ඡන්දෙ ගත්තා නෙවෙයි නේ. දැන් විපක්ෂයක් කියලා දෙයක් අපේ රටේ ඇත් තෙම නෑ. ඉතින් ඒක මහින්ද මහත්තෙයගෙ වැරැද්දක්ද? තව ටිකදවසකින් රනිල් මහත්තෙයත් අනේ මට විතරක් තනියම මේ පැත්තෙ ඉන්න බෑ කියලා රජය පැත්තට ඇවිත් වාඩි වේවි. එතකොට එපැයි කියන්නද? ඔන්න ඔහොමයි ලංකාවෙ දේශපාලනේ. අනේ මංකෙඳාක්කා!

**ගුරුදා -** දෙයියන්දර ඉන්න අපේ ලොකු නැන්දගෙ බාල
**THU** පුතා රත්නසිරි, ගිය මාසෙ ලියුමක් එවලා තිබුණා, එයාට දැන් ජීවිතේ එපා වෙලාය, රුපියල් පණස්දාහක් එවන්නය, නැත්නම් මොනව හරි බීලා මැරෙනවය කියලා. ඉතින් මැරෙන්න යන මිනිහට සල්ලි මක්කට දැයි කියලා, අපි සද්දනැතුව හිටියා. අද ලියුමක් එවලා තියනවා ගාණ විසිදාහට බස්සලා. අර මැරෙන කතාව දැන් නැහැ. එයා සිරසෙද මොකේද සිංදු කිව්වලු. එයාට **SMS** ඡන්ද කොච්චරදෝ ගණනක් හම්බ වෙලා, පස්වෙනියට ආවලු. සල්ලි ඉල්ලන්නෙ **CD** එකක් කපලා ගායකයෙක් වෙන්නලු.

**කිවිදා** - සන්ධ්‍යා ලංකාවට ගිය වෙලේ ලෙකුමාමා කියලා
**FRI** තියෙනවා දුවේ මාවත් එක්කන් පලයල්ලකො එහේ, අනේ මට මහ රැජිණී බලන්න ආසයි, එයා කෙල්ල කාලෙ නේ ලංකාවට ආවෙ, එතකොට මං ගැටයා, අපි ගෝල්පේස් ගියා එදා එතුමිය බලන්න කියලා. සන්ධ්‍යා නිකං කිව්වලු, බලමුකො එහෙනම්, කියලා. මාම දැන් පාස්පෝට් එකත් අරන් ලෑස්ති වෙලා ඉන්නවලු. නංගි සන්ධ්‍යාට කියලා එවලා තියෙනවා,අනේ ලොකු අක්කෙ ඕගොල්ල පෙරොන්දු වුනා නම්, මාමව කොහොම හරි ගෙනියන්න. මාම බලාගෙන ඉන්නවා. එහෙම බැරි නම් ඉන්දියාවට වත් යන්න ටිකට් එකක් එවන්න නැත්නම් මාමට හාට් ඇටැක් එකක් එන්න පුළුවන් කියලා. හරි වැඩේ දැන් සන්ධ්‍යාට සල්ලි යවන්න වෙලා.